

# කස්තිරම

## ඩී බී කුරුප්පු

ඇන් කල් පහු වෙලා ය. කොහොමටත් මේ රටේ අයට බලපාන්නේ නැත. මේ කියන්නේ අපේ මව් බිමේ සාහිත්‍යකරුවන් ගැනය. මා උපුටා දක්වූයේ ශ්‍රී ලාංකික ලේඛිකාවකගේ ප්‍රකාශයකි. ජනප්‍රිය ලේඛිකා කැත්ලීන් ජයවර්ධන ඉරුදින පත්තරයේ (2009 සැප්තැම්බර්) ප්‍රියන්ත කොඩිප්පිලි සමග පැවැත්වූ සංවාදයකදී පළ කළ අදහසකි.

මේ ලේඛිකාව නොහඳුනමි. ඇගේ පොත් කියවාද නැත. එහෙත් ඇය ගැන අපූරු මතකක් මට තිබේ. ශ්‍රී ලාංකික පුවත්පතකට කොටස් වශයෙන් ලියන නවකතාවක එක් කොටසක මා පරිවර්තනය කළ අන්තර්භවය ගැන සඳහන් කරන ඇය පොතේ කතුවරුන් නමින්ම දක්වන්නී ය. පරිවර්තනය හොඳ එකක් බවද කියා එහි එන අදහස් සමහරක් තමාගේ කතාවට උපයෝගී කර ගන්නා ඇය පරිවර්තකයාගේ නම වසන් කළේ හිතාමතාමදැයි නොදනිමි. එහෙත් ඒ ගැන සොයන්නට නොගියෙමි.

එම ලිපියෙන් මම ඇගේ ලේඛන හැකියාව ගැන අදහසක් ඇති කර ගතිමි. මෑතදී ඇය පළ කොට ඇති අදහස් ගැන අවධානය යොමු කරන්නට සිතුවේ ද ඒ නිසාම ය. පිටරටක වසන අපි බොහෝ දෙනෙක් උපන් බිම ගැන ඇළුමක් දක්වමු. රට වෙනුවෙන් දිවි පුදන්නට තරම් කැප වීමක් නැතත් රටේ දියුණුව ද පතත්නෙමු. අපේ උදවිය අතරින් සුළු පිරිසක් හෝ බස ගැන ඒ තරම්ම ළැදියාවක් පළ කරන්නෝ ය. එක අතකින් රට ගැන කියන්නට වඩා බස ගැන කතා කරන්නට අයිතියක් අපට ඇත. ඒ රටට මෙන් නොව බසට දේශ සීමා ඉක්මවා යන බලයක් ඇති නිසා ය.

විප්‍රවාසී සිංහල ලේඛකයන් බහුතරය වාසය කරන්නේ ඕස්ට්‍රේලියාවේ යයි ද සිතමි. එංගලන්තයේ වාසය කරන සිංහල කිවිඳියක ලියූ කවි පොතක් මා ළඟ ඇත. ප්‍රංශයේ ඊට වැඩි ගණනක් කිවිඳියන් හා නවකතා කරුවන් සිටින බව දනිතත් මා කියවා ඇත්තේ අර කිවිඳියගේ කවි පොත පමණි. හද්‍රජී මහින්ද ජයතිලක හැරුණු විට අමෙරිකාවේ සිටින සිංහල ලේඛකයකු ගැන මා අසා නැත. විදේශගත ලේඛකයන් අතුරින් ශ්‍රී ලංකාවේ සම්මාන ලැබූ එකම පුද්ගලයා හද්‍රජී යයි සිතමි. අපේ උදවිය යටත් පිරිසෙයින් මව් බිමට ගොස් පොත් එළිදැක්වීමේ උත්සව වත් පවත්වන්නෝ ය.

තෑගි දිනුවත් නැතත් සාහිත්‍ය මාසයේ සිදුවන දේ ගැන අපි කවුරුත් විමසිලිමත් වන්නෙමු. එහි සිටින ලේඛක ලේඛිකාවන් සමග අපබොහෝ දෙකනුට කිසියම් සබඳතා ද ඇත . යටත් පිරිසෙයින් ඔවුන් කරන කියන දේ අසා - කියවා - අපට පහන් සංවේගයක් ලබන්නට පුළුවනි.

සාහිත්‍ය මාසය තුළ ලේඛක ලේඛිකාවන් අතර සුහදතාව ගිලිහෙන බව කැත්ලීන් ජයවර්ධන පවසයි. අපේ ලේඛකයන් අතර නොයෙක් විදියේ අරියාදු - අමනාප - ඇතිබව දන සිටියත් සාහිත්‍ය මාසය තුළ දී මේ විදියට උග්‍ර වන නොරිස්සුමක් ගැන මා නොදත් බව කියමි. ඩබ්ලිව් ඒ සිල්වා මාර්ටින් වික්‍රමසිංහ ආදීන් එකිනෙකා නුරුස්නා වාතාවරණයක් පැවති බව අසා තිබුණත් මේ තරම් මෝසමකට අසාධ්‍ය වන රෝගයක් තිබීම අවාසනාවකැයි සිතමි.

මේ තත්වයට සාහිත්‍ය මාසය වාණිජකරණයට ගොදුරු වීම හේතුවක් බව ද ඇය සඳහන් කරයි. සැප්තැම්බර් මාසය වන විට බොහෝ මුද්‍රණකරුවන්ට කාර්ය බහුල කාලයක් උදාවන බව මම දන සිටියෙමි. සාහිත්‍ය සම්මාන බලා ගෙන පිටවන පොත් හනි හනික මුද්‍රණය කරන්නට සිදුවීම නිසා ය. එසේ නිකුත් කරන පොත පතින් සාහිත්‍ය වර්ධනයට ලැබෙන රුකුලක් ඇද්ද යන්න ද ප්‍රශ්නයකි.




සාහිත්‍ය විචාරය ගැන ඇය කියන කතාව අතිශය ශෝකජනකය. එය බෙදවාචකයකැයි කැත්ලින් ජයවර්ධන කියන්නේ අත්දැකීම් ඔස්සේ විය යුතු ය. මෙන්න ඇගේම වචනයෙන් ඒ අවාසනාවන්ත තත්වය.

"අද විචාරකයෝ ඉන්නේ කල්ලි එක්ක. තමන්ගෙ කල්ලියේ අයගේ දේවල් ගැන අගය කරනවා. තමන්ගේ කල්ලියට විරුද්ධ නම් නිර්දය විදියට ගහනවා. අද මධ්‍යස්ථ විචාරය කියන වචනය විහිළුවට ලක් වෙලා"

මධ්‍යස්ථ විචාරයක් නැති සමාජයක සාහිත්‍ය වර්ධනයක් පැතිය හැකි ද? කොළඹ - පේරාදෙණි හබය උග්‍රව පැවති යුගයේ වුවත් පිළිගත හැකි විදියේ සාධාරණ විවේචනයක් - අගැයීමක් - දීමට සමත් පුද්ගලයෝ කොතෙකුත් සිටියහ. ඔවුන්ගේ අදහස් ගරු කිරීමට පාඨකයා ද පුරුදුව සිටියේ ය. ඒ යුගයට වඩා බෙහෙවින් පොත පත බිහිවන අද වැනි දවසක විචාරය ඊට වඩා ප්‍රබලව - තියුණුව - තිබිය යුතු බව කියනවා හැරෙන්නට අප වැන්නන්ට කළ හැකි දෙයක් නැත.

මෙම ප්‍රවණතාව සරසවියෙන්ම පටන් ගත්තක්ද යන සැකය මට ඇතිවන්නේ මා ඇසූ පුවතක් නිසා ය. මහාචාර්ය නලින් ද සිල්වා ගැන කතා කළ කැළණිය සරසවියේ නිලදරුවෙකුගෙ න්. බොහෝ උපාධි අපේක්ෂකයන් නලින් ද සිල්වා ගේ අදහස් පිළිගන්නා නමුත් ඒ කිසිවක් පිළිතුරු පත් වලට ඇතුළත් නොකරන්නට පරිස්සම්වන බව ය ඔහු කීවේ. ඒවා ලියන්නට ගියොත් නලින්ගේ අදහස් නුරුස්සන ආචාර්ය මහාචාර්යවරුන්ගෙන් ලකුණු ලබනවා තබා සාමාර්ථයක් ගැනීමත් අපහසු බව ඔහු අවධාරණය කළේ ය.

සාහිත්‍යය පමණක් නොව බුද්ධිය මෙහෙයවා කරන කවරක් වුව පල දරන්නට නම් මත ගැටීමක් - විවිධ අදහස් හුවමාරු කිරීමක් - තිබිය යුතු ය. මේ කියන විදියේ වාතාවරණයක් එම බුද්ධිමය ව්‍යායාමයට කිසිදු අවසරයක් නොදෙනු ඇත . එම වාතාවරණයේම තවත් අහිතකර පක්ෂයක් කැත්ලීන් ජයවර්ධන පෙන්වා දෙන්නීය. යළිත් ඇගේ වචන උපුටා දක්වමි.

"අපේ රටේ මර්මස්ථාන කියලා හඳුනාගෙන තියෙන තැන්වල වගකීම් දරන්නේ ඊට කොහෙත්ම සුදුසු නැති පුද්ගලයෝ. දේශපාලකයන්ට "සර්" කියන්න පුලුවන් වීම ඇරෙන්න වෙන සුදුසු කමක් ඒ බොහෝ දෙකනුට නැහැ. බුද්ධිමතුන් සහ අවංක සේවයක් කළ හැකි බොහෝ දෙනා අද ඉන්නේ ගෙවල් වලට වෙලා"

සාහිත්‍ය සම්මාන ගැන කී මගේ මිතුරෙක් වරක් එසේ සම්මාන ලැබූ සිවිල් සේවකයකු ගැන ද සඳහන් කළේ ය. එම නිලධාරියා තීරණය ගන්නා පිරිස රැස්වන කාමරයෙන් පිටත මුර තබා ගෙන ඔවුන් එළියට එන තෙක් බලා සිටින බව මගේ මිතුරා කී විට මම විශ්වාස නොකළෙමි. එහෙත් කැත්ලීන් ජයවර්ධනගේ කතාවට අනුව එය අරුමයක් ද විය නොහැකි ය. මෙන්න ඇය තෑගි දීම නොහොත් ලැබීම ගැන කියන කතාව.

"පසුගිය කාලය පුරාවට විමසලා බැලුවොත් නවකතා කෙටිකතා කවිය සම්බන්ධව තියෙන හැම සම්මාන උළෙලකදීම සම්මාන ලැබිලා ගියෙන්නේ එක්තරා පිරිසකට. ඒක දැන් ලේඛනගත වෙලා වාගේ"

පළපුරුදු ලේඛිකාවක කරන ප්‍රකාශයක් නිසා මේ කියමන සුළු කොට තැකිය නොහැකිය. ශ්‍රී ලංකාවේ සිදුවන සමහර දේ ගැන කම්පා වීමට අපට හැකි වුවද එයින් වන සෙතක් නැත . කොහොමටත් එබඳු කිසිවක් වෙනස් කිරීමට තබා ඒ කෙරෙහි මඳ වූත් බලපෑමක් කරන්නට අපට මෙහි සිට බැරි ය. අපගේ සැනසීමකට ඇත්තේ අපේම බසින් නොවුවද මේ රටේ සාහිත්‍ය කටයුතු සිදුවන ආකාරයත් ලේඛක ලේඛිකාවන්ගේ කාර්යභාරයත් නිරීක්ෂණයෙන් වැදගත් පාඩම් උගන්නට අවසර ලැබීමය.

අනෙක් අතට අප කැමති වුවත් නැතත් ශ්‍රී ලාංකික ලේඛකයන්ගේ ක්‍රියාකාරීත්වය කෙසේ වෙතත් ඔවුන්ගේ බලපෑම වළක්වන්නට බැරිය. අප නොරිස්සුවත් සමහර අහිතකර ලක්ෂණ අගය කරන පාඨක පිරිසක් මේ රටේද ඇති වීම අනිවාර්යය. අපට කළ හැකි එකම දේ එරට - මෙරට - දෙකේම ලේඛක - පාඨක දෙපක්ෂය ම ලේ රත් කර නොගෙන නිවී සැනසිල්ලේ සාහිත්‍ය රසාස්වාදයට පුරුදු වෙතැයි බලාපොරොත්තු වීම ය.

**මෙම ප්‍රවණතාව සරසවියෙන්ම පටන් ගත්තක්ද යන සැකය මට ඇතිවන්නේ මා ඇසූ පුවතක් නිසා ය. මහාචාර්ය නලින් ද සිල්වා ගැන කතා කළ කැළණිය සරසවියේ නිලදරුවෙකුගෙන්. බොහෝ උපාධි අපේක්ෂකයන් නලින් ද සිල්වා ගේ අදහස් පිළිගන්නා නමුත් ඒ කිසිවක් පිළිතුරු පත් වලට ඇතුළත් නොකරන්නට පරිස්සම්වන බව ය ඔහු කීවේ. ඒවා ලියන්නට ගියොත් නලින්ගේ අදහස් නුරුස්සන ආචාර්ය මහාචාර්යවරුන්ගෙන් ලකුණු ලබනවා තබා සාමාර්ථයක් ගැනීමත් අපහසු බව ඔහු අවධාරණය කළේ ය.**

